# දිළිඳුකම පිටුදැකීමේ ජාතික වැඩපිළිවෙළ සහ ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරය

## හැඳින්වීම:

ශ්‍රී ලංකාව තුළ ජීවත්වන ජනතාව අතරින් 6.7 % ක් පූර්ණ දුගීභාවයෙන් පෙළෙන බව ප්‍රකාශ වී තිබේ. දරිද්‍රතා මට්ටම එසේ සාපේක්ෂ වශයෙන් අඩු මට්ටමක පවතින බව පෙනී ගිය ද, 2012/13 සංඛ්‍යා ලේඛන අනුව පෙනී යන කරුණක් නම්, දරිද්‍රතා රේඛාවෙන් ඉහළ ආසන්න තීරුවේ සිටින දිළිඳු ජන සංඛ්‍යාව ද ඉහළ බවයි. ඒ අනුව, දරිද්‍රතා රේඛාව 10%කින් ඉහළ ගිය හොත්, මිලියන 1.34ක් වූ දිළිඳු ජන සංඛ්‍යාව මිලියන 2ක් දක්වා ඉහළ යන බවත්, දරිද්‍රතා අනුපාතය 9.9%ක් වන බවත් ප්‍රකාශිත ය. රට තුළ දුගීභාවයේ ප්‍රතිශතය අවම වී ඇති බවට දත්ත මගින් කියවෙන්නේ, පවත්නා අන්ත දුගීභාවය හෙවත් නිරපේක්ෂ දුගී ජන සංඛ්‍යාව පහත බැස ඇති බවයි. එහෙත්, ශ්‍රී ලංකාව මුහුණදී සිටින විශාලතම අභියෝගයක් නම්, පවත්නා සාපේක්ෂ දුගීභාවය යි. මෙකී තත්ත්වය, රටේ ප්‍රගතිශීලී සංවර්ධනය තුළ කියැවෙන ආර්ථික, සමාජයීය හා සංස්කෘතික ප්‍රගමනයට මෙන්ම මානව අභිමානය පදනම් කොට ගත් පුද්ගල සංවර්ධනය කෙරෙහි ද අභියෝගාත්මක බලපෑමක් ඇති කොට තිබෙන බව අවිවාදිතය. ආර්ථික සංවර්ධනය දෙසින් ගත් කල, වෙළඳපොළ ආර්ථිකය මත බොහෝ දුරට පදනම් වූ දේශපාලනික ආර්ථිකයක් පිළිබඳව අපි කතා කරමු. එහිලා වැදගත් වන්නේ පාරිභෝගිකයින්ය. මෙවැනි තත්ත්වයක් මගින් ශ්‍රී ලාංකික සමාජ දේහය තුළ ඇති කරනු ලබන ආර්ථික හා සමාජයීය බලපෑම ඉහළ වේ.

එක් අතකින් මෙවැනි පරිසරයක් තුළ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්වයට පවතින්නා වූ ඉඩකඩ අවම වෙයි. ඕනෑම රටක ධනය (Wealth) උපදවන්නා වූ සමාජ තීරුවක පැවැත්ම අත්‍යවශ්‍ය සාධකයකි. අපනයන ආර්ථිකයකට සම්බන්ධ වන මහා පරිමාණ ව්‍යවසායකයින් හා කුඩා පරිමාණ ව්‍යවසායකයින් හැරෙන්නට රට තුළ මෙම මධ්‍යම හා සුළු ව්‍යවසායකත්වය අවම අගයක් ගැනීම හේතුවෙන්, රටේ ව්‍යවසායකත්වය රටේ ජනගහනයෙන් 03% ක ප්‍රමාණයකට සීමා වී තිබේ. ශ්‍රී ලංකාව තරම් ම කුඩා රටක් වන ඊශ්‍රායලය තුළ මෙම ප්‍රතිශතය 20% ක් වන බව වාර්තා වෙයි. මෙම තත්ත්වය හේතු කොට ගෙන උද්ගතවී ඇති බරපතළ සමාජ ආර්ථික ගැටලුව වන්නේ රටේ ජනගහනයෙන් 45% ක ප්‍රමාණයක් දළ ජාතික නිෂ්පාදිතයෙන් දහයෙන් එකක් පමණ භුක්ති විඳිද්දී, ජනගහනයෙන් 05% කට ආසන්න (අති-ධනවත් පන්තියක්) ප්‍රමාණයක් දළ ජාතික නිෂ්පාදිතයෙන් අඩකට ආසන්න ප්‍රමාණයක් භුක්ති විඳීමයි. ඉන් හෙළි වන්නේ රට තුළ පවතින ආදායම් විෂමතාවයි. මෙම තත්ත්වය බොහෝදුරට රට තුළ සමාජ හා දේශපාලනික අසමතුලිතභාවයට හේතුවන බව අවිවාදිතය. රට තුළ පවතින ආදායම් විෂමතාව නැවත නාගරික, ග්‍රාමීය හා වතුකරය ලෙස විභේදනය කරන කල්හි වතුකරයේ ආදායම් විෂමතාව ඉතා ඉහළ අගයක් ගන්නා බව අපි දනිමු.

මෙම තත්ත්වයන් සමස්තයක් ලෙස සැලකිල්ලට ගත් කල, රට තුළ පවතින පූර්ණ දුගීභාවය මෙන්ම සාපේක්ෂ දුගීභාවය මගින් රටේ ආර්ථික සංවර්ධනයට ප්‍රබල බලපෑමක් එල්ල වී ඇති බව යටපත් කළ නොහැකි යථාර්ථයකි. එබැවින්, සාර්ව ආර්ථික කළමනාකරණ ක්‍රියාමාර්ගයන්ට සමාන්තරව අගහිඟකම් නිසා පවුල් අයවැය තුලනය කරගැනීමට නොහැකිව පීඩනයට පත්වන දරිද්‍ර ජනතාවට වඩාත් පුළුල් අවස්ථා ඇති කිරීම වැදගත් වෙයි. එම අවස්ථා ප්‍රාදේශීය මට්ටමින් හඳුනාගෙන ක්‍රියාත්මක වීමට රට තුළ ක්ෂුද්‍ර ආර්ථික කළමනාකරණයක් සඳහා වන ප්‍රවේශයක් අත්‍යාවශ්‍යව තිබේ.

එසේම, පවතින ආර්ථික විෂමතාව මගින් කියවෙන්නේ දිළිඳු ජනතාව වෙත විශේෂ අවධාරණයක් සහිතව රටේ සංවර්ධනය පිළිබඳව නව මානයක් ගොඩනගාගත යුතුව තිබෙන බවය. ආසියානු කලාපය තුළ මානව සංවර්ධන දර්ශකයන්ගේ ඉහළ වර්ධනයක් පෙන්නුම් කර ඇති ශ්‍රී ලාංකික සමාජය තුළ, ආදායම් පරතරය අවම කොට අභිමානයක් සහ යුතුකම් හා අයිතිවාසිකම් පිළිබඳ සංවේදී, මානව සමාජයක් ගොඩනැගීම පිළිබඳ දැක්මක්, යථාර්ථයක් වනු දැකීමට සමත්, පුළුල් සංවර්ධන වැඩසටහනක අවශ්‍යතාවය මේ වන විට ශ්‍රී ලාංකික සමාජය අභියසට පැමිණ තිබේ. ඒ සඳහා වන ක්‍රියාත්මක මෙහෙයුමක් හා ප්‍රතිඵල පදනම් කොට ගත් දිළිඳුකම පිටුදැකීමේ ප්‍රායෝගික වැඩපිළිවෙළක්, දැනට ක්‍රියාත්මක රාජ්‍ය සහ රාජ්‍ය නොවන දිළිඳුකම පිටුදැකීමේ බහුවිධ වැඩපිළිවෙළට සමාන්තරව ගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් හඳුන්වා දෙනු ලැබ තිබේ.

## 2017 වර්ෂය, දිළිඳුකම පිටුදැකීමේ වර්ෂයයි:

ගරු ජනාධිපතිවරයා විසින්, වර්ෂ 2015 ජනවාරි 08 දා දිනාගත් ජනතා ජයග්‍රහණය යථාර්ථයක් කරනු වස් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සඳහා 19 වැනි සංශෝධනය හඳුන්වාදෙමින්, අප රට ප්‍රජාතන්ත්‍රවාදී, ශිෂ්ටසම්පන්න හා මානවවාදී සමාජයක් ගොඩනැගීම සඳහා වන මූලික ව්‍යුහමය අඩිතාලම ඉදි කොට තිබේ. ශ්‍රී ලාංකික ජනතාවගේ සැබෑ නිදහස හා සමානාත්මතාව පිළිබඳ ප්‍රාර්ථනය යථාර්ථයක් කරනු පිණිස රටේ බහුතරයක් වන බල රහිත ජනතාව ආර්ථිකමය හා සමාජමය වශයෙන් බල ගන්වනු වස් 2017 වර්ෂය දිළිඳුකම පිටුදැකීමේ වර්ෂය ලෙස නම් කරන්නට යෙදුණේය.

ගරු ජනාධිපතිවරයාගේ එම දැක්ම අනුව යමින්, ගරු සරත් අමුණුගම අමාත්‍යතුමාගේ දායකත්වයෙන් යුතුව කැබිනට් අනු කමිටුවක් පත් කෙරුණු අතර, එම කැබිනට් අනු කමිටුව මගින් ශ්‍රී ලංකාව දිළිඳුකමින් නිදහස් කිරීමේ ජාතික වැඩසටහන සහ උපාය මාර්ගික ප්‍රවේශය හඳුන්වාදෙනු ලැබුවේය. ඒ යටතේ පහත සඳහන් සිවු වැදෑරුම් ප්‍රතිපත්තිමය ප්‍රවේශය රටට හඳුන්වා දෙනු ලැබිණි. එකී ප්‍රවේශය වූයේ;

- පිටුදැකිය යුතුව ඇති දිළිඳුකමේ ස්වභාවය, පවුල් හා ප්‍රදේශය පිළිබඳ ඉලක්ක හඳුනාගැනීම,
- දිළිඳුබවට බලපාන හේතු නැති කිරීම සඳහා වන රාජ්‍ය අංශයේ මැදිහත් වීම සැලසුම් කිරීම,
- දිළිඳුබවට බලපාන හේතු නැති කිරීම සඳහා වන ජනතා අංශයේ මැදිහත් වීම සැලසුම් කිරීම, සහ
- දිළිඳුබවට බලපාන හේතු නැති කිරීම සඳහා නිර්මාණශීලී පෞද්ගලික අංශයේ මැදිහත්වීම සැලසුම් කිරීම වේ.

**මෙහෙයුම :**

මෙකී සැලසුම් බහුවිධ අංශයන්ගේ සමායෝජනය තුළින් ක්‍රියාත්මක කිරීම සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතියෙන් ජනාධිපති කාර්යාලය යටතේ දිළිඳුකම පිටුදැකීමේ ලේකම් කාර්යාලයක් දැනටමත් පිහිටුවා තිබේ. මෙම කාර්යාලය පළාත්, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ක්‍රියාත්මක වන මෙහෙයුම් කමිටු හා එක්ව ක්‍රියා කරනු ඇත. ග්‍රාම නිලධාරි වසම් මට්ටමේ සැලසුම්කරණය හා ක්‍රියාත්මක වීමේ මෙහෙයුම ගමෙහි නීත්‍යානුකූලව පිහිටවූ සංවිධානය මගින් ක්‍රියාත්මක වේ.

## දිළිඳුකමේ ස්වභාවය, ප්‍රමාණය හා පිටුදැකීමේ ඉලක්ක ප්‍රදේශ :

මෙම ප්‍රවිෂ්ටය යටතේ රටේ පවතින දිළිඳුකම නිශ්චිතව හඳුනාගැනීම සඳහා විද්‍යාත්මක පදනමින් යුත් විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීමේ සැලසුම් මේ වන විටත් ජනාධිපති කාර්යාලය යටතේ පිහිටුවා ඇති **දිළිඳුකම පිටුදැකීමේ ලේකම් කාර්යාලය** මගින් රාජ්‍ය හා රාජ්‍ය නොවන පර්යේෂණ ආයතනයන්හි සහභාගීත්වයෙන් ආරම්භ කොට තිබේ.

මෙකී ක්‍රියාවලිය යටතේ දැනටමත් දිළිඳුකම පිටුදැකීමේ වැඩපිළිවෙළෙහි මූලික ඉලක්කයන් ලෙස රට තුළ පවතින, නිරපේක්ෂ සහ සාපේක්ෂ යන ද්වි-විධ දුගීභාවය පිටුදැකීම හඳුනාගෙන තිබේ. ඒ යටතේ අවධාරණය කරනු ලබන ජන කණ්ඩායම් ලෙස සැලකෙන,

- ග්‍රාමීය ජනතාවගේ දිළිඳුකම පිටුදැකීම, සහ
- නාගරික ජනතාවගේ දිළිඳුකම පිටුදැකීම, කෙරෙහි අවධානය යොමු කෙරේ.

එහිදී, **දිළිඳු ජන සංඛ්‍යාව වැඩි වශයෙන් ජීවත් වන දිස්ත්‍රික්ක වෙත ප්‍රමුඛතාව ලබා දෙමින්, ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරය දීප ව්‍යාප්ත වශයෙන් ක්‍රියාත්මක කෙරෙනු ඇත. දැනට ප්‍රජාපාලිත ග්‍රාම සංවර්ධන ප්‍රවේශය අනුගමනය කරන ජනතා සමාගම් නැවත සක්‍රීය කිරීමට නියමිතය.**

එසේම, ජන කණ්ඩායම් ලෙස ගත් කල පහත සඳහන් ප්‍රමුඛතාවයන් පිළිබඳව මෙම වැඩසටහන අවධාරණය කොට සිටී.

- යුද පසුබිමෙහි ජීවත් වූ ජනතාව
- වතුකරයේ ජනතාව
- කාන්තාවන්
- තරුණ තරුණියන්

ඉහත කී සියලු විභේදනයන්ට යටත්ව, දිළිඳුකම පිටුදැකීමේ වැඩසටහන්, පළමුව කෘෂිකර්ම ක්ෂේත්‍රය වෙතට ද ඊට සමාන්තරව සේවා සහ කර්මාන්ත ක්ෂේත්‍රය වෙතට ද යොමු කරනු ඇත.

## දිළිඳුකම පිටුදැකීම සඳහා වන රාජ්‍ය අංශයේ මැදිහත්වීම :

මෙය දෙආකාරයකින් සිදුවේ.

(1) දිළිඳුකම පිටුදකිමින් ගමෙහි සංවර්ධනය ඇති කෙරෙන වේදිකාව ලෙස සැවොම ඇතුළත් කෙරෙන (Inclusive) හා වගවීමෙන් ක්‍රියා කරන ග්‍රාමීය ආයතන ගොඩනැංවීම.

(2) දිළිඳුකම පිටුදැකීමේ ජාතික කැඳවුමට ප්‍රතිචාර දක්වමින් ඒ සඳහා සිය අවකාශය ඉදිරිපත් කරන රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වැඩසටහන් දිළිඳු ප්‍රදේශ හා ප්‍රජාව කරා යොමු කිරීම.

ක්ෂුද්‍ර ආර්ථිකයේ මෙහෙයුම් මධ්‍යස්ථානය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයයි. සමස්ත සාර්ව ආර්ථික රාමුව තුළ, දුගී බව තුරන් කිරීම සඳහා වන විශේෂ අවධාරණයක් සහිතව මූලික වශයෙන් ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් ඇරඹී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ප්‍රදේශයේ ක්ෂුද්‍ර ආර්ථික සංවර්ධන සැලැස්මක් ගොඩනැගීමේ මූලික වගකීම අදාළ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයාට සහ එම කාර්යාලයට අනුබද්ධිත සැලසුම් ඒකකයට පැවරෙනු ඇත. හැකිතාක් දුරට පවත්නා භෞතික හා මානව සම්පත් යොදා ගනිමින් එකී ප්‍රාදේශීය ලේකම්වරයා සහ සැලසුම් ඒකකයේ නිලධාරීන්ගෙන් ප්‍රාදේශීයව ක්‍රියාත්මක වන රාජ්‍ය, පෞද්ගලික හා රාජ්‍ය නොවන ආයතන ප්‍රධානීන්ගෙන් සමන්විත සැලසුම් හා මෙහෙයුම් කමිටුවක් මේ සඳහා ගොඩනංවනු ඇත.

## ප්‍රාදේශීය මට්ටමේ සහභාගීත්ව සංවර්ධන සැලසුම්කරණය :

ප්‍රාදේශීය සැලසුම් ඒකකය විසින් අදාළ ප්‍රදේශයේ පිහිටි සෑම ග්‍රාම නිලධාරි වසමකින් පහත සඳහන් ප්‍රාථමික දත්ත රැස්කරවීම සිදුකළ යුතුව තිබේ. එම ප්‍රාථමික තොරතුරු පහත සඳහන් නිර්ණායක මත සපයා ගත යුතුව තිබේ. දැනටමත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල එක්රැස් කර ඇති දත්ත යාවත්කාල කිරීමෙන් සැලසුම්කරණය සඳහා අවශ්‍ය තොරතුරු සපයා ගැනීමට ඉඩ ඇත. ගමේ ප්‍රජාව ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් තම ප්‍රදේශ සංවර්ධනය සැලසුම් කරන අවස්ථාවේ මෙම තොරතුරු ඔවුන් වෙත තිබිය යුතු වන අතර එම සැලසුම් ඒකාබද්ධ වීමෙන් සැදෙන ප්‍රාදේශීය මට්ටමේ සැලැස්ම එමඟින් යථාර්ථවත් වීම අපේක්ෂා කෙරේ.

- භාවිත කරනු ලබන හා දැනට භාවිත නොකරන ස්වභාවික සම්පත්,
- ආයෝජනය කරනු ලබන හා දැනට ආයෝජනය නොකරන මානව සම්පත්,

- ප්‍රදේශයේ පවතින ජීවනෝපාය අවස්ථා
- ප්‍රාදේශීයව සපයා ගත හැකි හා ව්‍යාපෘති සඳහා යොදාගත හැකි ප්‍රාදේශීය සම්පත්,
- ආහාර සුරක්ෂිතතාව පිළිබඳ වර්තමාන තත්ත්වයන් සහ ආහාර සුරක්ෂිතතාවය පවත්වා ගැනීම සඳහා පවතින අවශ්‍යතාවයන්,
- මුහුණ දිය හැකි ආපදා තත්ත්වයන්,
- පොදු අවශ්‍යතා සපිරීම සඳහා අත්‍යවශ්‍ය වන්නා වූ රාජ්‍ය, පෞද්ගලික හා රාජ්‍ය නොවන ආයතන,
- ග්‍රාමීය යටිතල පහසුකම් පිළිබඳ අවශ්‍යතා,
- සම්පත් / ධනය උත්පාදනය කිරීමේ අවස්ථා,
- ප්‍රදේශයේ ජනතාවගේ අභිලාෂයන්,
- පවතින භාවිත කළ හැකි සම්පත් හා පවතින ආයතනික රාමුව එක්තැන් කරමින් හා සමායෝජනය කරමින් ප්‍රදේශයේ පවතින දිළිඳුකම පිටුදැකීම හා ප්‍රදේශය සංවර්ධනය කිරීමේ හැකියාව හා අවස්ථා,
- ඒ සඳහා අවශ්‍ය වන්නා වූ නව ආයතනික අවශ්‍යතාව.

## ග්‍රාමශක්ති වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණය :

ප්‍රාදේශීය මට්ටමෙන් හඳුන්වා දෙන ග්‍රාමශක්ති වැඩසටහන සැලසුම් කිරීමට හා ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැපයීම ප්‍රාදේශීය ලේකම්වරයාගේ වගකීමකි. ගොඩනැගෙන ප්‍රාදේශීය සංවර්ධන වැඩපිළිවෙළ තුළ ග්‍රාමශක්ති වැඩසටහනට මූලික අවධාරණය හිමි විය යුතුව තිබේ.

## ගම/ග්‍රාම සේවා නිලධාරි වසම : ජනතාවගේ මූලික අවශ්‍යතා සපිරෙන ඒකකයයි:

ජනාධිපති ලේකම් යටතේ පිහිටුවන ලබන දිළිඳුකම පිටුදැකීමේ ලේකම් කාර්යාලය මගින් හඳුන්වා දෙන **ප්‍රජා පාලිත ග්‍රාමශක්ති වැඩපිළිවෙළ** ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් සැලසුම් කිරීම ඇරඹී ක්‍රියාත්මක වන්නේ ග්‍රාම නිලධාරි වසම් මට්ටමිනි. එසේම ඉහත කී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පදනම් කොට ගෙන පිහිටවනු ලබන ප්‍රාදේශීය සැලසුම් කිරීමේ සහ මෙහෙයුම් ඒකකය විසින් ඉහත කී ප්‍රාථමික දත්ත හා තොරතුරු, සහභාගීත්ව සංවර්ධන සැලසුම්කරණයක් තුළින් සපයාගත යුතුව තිබේ. එහිදී අදාළ ජනතාව සහ ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් ක්‍රියාත්මක වන සංවර්ධන නිලධාරීන් එම කාර්යයට සහභාගී කරවා ගැනීම සහ ඔවුන් එම සැලසුම්කරණයේ කොටස්කරුවන් බවට පත්කරවා ගැනීම අදාළ සැලසුම් හා මෙහෙයුම් කමිටුවේ වගකීමක් වනු ඇත. එසේ ලබාගන්නා ප්‍රාථමික දත්ත භාවිත කොට ගමෙන් සකස් වන සැලසුම් අනුව ගමෙහි මූලික අවශ්‍යතා සැපිරීම අරමුණු කොට ගත් ප්‍රාදේශීය

සංවර්ධන සැලැස්මක් ගොඩනැංවීම මෙහි අවසාන ප්‍රතිඵලයයි. එහිදී පහත සඳහන් අවශ්‍යතා පිළිබඳව අදාළ සැලැස්ම මගින් අවධාරණය කිරීම අත්‍යවශ්‍ය සාධකයකි.

- ග්‍රාම නිලධාරි වසම් තුළ ජීවත් වන පූර්ණ දිළිඳු කණ්ඩායම් වල ජීවන අවශ්‍යතා.
- ග්‍රාම නිලධාරි වසම් තුළ ජීවත් වන සාපේක්ෂ දිළිඳු කණ්ඩායම් වල ජීවන අවශ්‍යතා.
- කාන්තාවන් / තනි කාන්තා ගෘහ මූලිකයන්ගේ ජීවන අවශ්‍යතා.
- රැකියා විරහිත තරුණ තරුණියන්ගේ ජීවන අවශ්‍යතා.
- උතුරු නැගෙනහිර ප්‍රදේශවලදී යුද්ධයට මැදිවූ ජන කණ්ඩායම්වල ජීවන අවශ්‍යතාවයන්.
- වෙනත් ආකාරයකින් සවිබල ගැන්විය යුතු කණ්ඩායම්.
- ව්‍යවසායකත්වය සහිත හෝ ව්‍යවසායකත්වයට එළඹීමට අවැසි පුද්ගලයින්ගේ ජීවන අවශ්‍යතා.
- ප්‍රදේශයේ ජනතාවගේ ණය බර හා ඉන් මුදවාලීමට ඇති අවස්ථා.
- ව්‍යවසායකත්වය සඳහා වන ප්‍රාග්ධනය සපයාගැනීමේ අවස්ථා.
- හඳුනාගෙන ඇති ජීවන මාර්ග සැපයීමේ අවස්ථාවන්ගේ තිරසරභාවය.

මෙම සැලසුම්කරණයේ ප්‍රතිඵල වන්නේ අවශ්‍යතා හා වර්ධනය පදනම් කරගත් ප්‍රමුඛතාවන් සහ ඒවා සඳහා සම්පත් යෙදවීමයි. අවසාන වශයෙන් ග්‍රාමශක්ති වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා එම සැලසුම් භාවිත කරනු ඇත.

## දිස්ත්‍රික්කය සේවා යොමු කිරීමේ සහ පසුවිපරම් කිරීමේ ඒකකයයි :

අදාළ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත ප්‍රාදේශීය සංවර්ධන සැලසුම් ගොඩනැගීමෙන් පසුව, එකී සැලසුම් ක්‍රියාත්මක කිරීමෙහි ලා පවතින රාජ්‍ය සේවා, කාර්යක්ෂමව හා සඵලදායක ලෙස, ග්‍රාම නිලධාරි වසම් මට්ටමේ ජනතාවගේ මූලික අවශ්‍යතා සපිරීම සඳහා යොමු කිරීම අදාළ දිසා ලේකම්වරයාගේ වගකීමක් වනු ඇත. එහිදී එම කාර්යය සඳහා තමන් ද සාමාජිකයෙකු වන පළාත් සැලසුම් කමිටුවේ උපදේශනය ලබාගත හැකිය. මෙහිදී දැනටමත් ක්‍රියාත්මක දිළිඳුකම පිටුදැකීමේ වැඩපිළිවෙළෙහි උපරිම සහාය, ප්‍රාදේශීය සංවර්ධන වැඩපිළිවෙළ යථාර්ථයක් කිරීම සඳහා යොදවා ගැනීම අත්‍යවශ්‍ය කරුණක් වන්නේය.

එසේම දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක ප්‍රාදේශීය සංවර්ධන සැලසුම් වල පසුවිපරම්කරුවා වන්නේ ද දිසා ලේකම්වරයා සහ දිස්ත්‍රික් සැලසුම් ඒකකයයි. සංවර්ධන ප්‍රගතිය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත වාර්තා කෙරෙනු ඇත.

## පළාත් මෙහෙයුම් කමිටුව :

දිළිඳුකම පිටුදැකීමේ සංවර්ධන වැඩපිළිවෙළ හා ප්‍රාදේශීය සංවර්ධන වැඩපිළිවෙළ පළාත් වශයෙන් මෙහෙයවීම සඳහා පළාත් සැලසුම් ඒකකයක් බිහි කරනු ඇත. එහි සාමාජිකයන් වන්නේ,

- පළාත් ප්‍රධාන ලේකම්,
- දිස්ත්‍රික් ලේකම්,
- පළාත් අමාත්‍යාංශ ලේකම්වරු, සහ
- පෞද්ගලික අංශයේ නියෝජිතයින් වශයෙනි.

මෙම කමිටුව විසින් පළාත් සභාව මගින් ක්‍රියාත්මක කරන සංවර්ධන වැඩපිළිවෙළ ද, මධ්‍යම ආණ්ඩුව විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩපිළිවෙළ ද, මෙම නව ව්‍යාපෘතිය යටතේ ගොඩනගනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමේ ක්ෂුද්‍ර සංවර්ධන වැඩපිළිවෙළ ද ඒකාග්‍ර කිරීම, සම්බන්ධීකරණය හා ප්‍රතිඵල පදනම් කොට ගත් පසුවිපරම් හා අවසාන වශයෙන් මෙම සියලු වැඩසටහන්වල තිරසරබව සාක්ෂාත් කිරීම සඳහා වන ප්‍රතිපත්තිමය තීරණ ද, ගනු ලබනවා ඇත.

පළාත් මෙහෙයුම් කමිටුව තිරස්ව, පළාත් සභාව හා දිස්ත්‍රික්ක ලේකම්වරයා සමග සම්බන්ධීකරණයට ලක්වන අතර, සිරස්ව ජනාධිපති ලේකම් යටතේ පිහිටුවා ඇති ලේකම් කාර්යාලය සමග සම්බන්ධීකරණය පවත්වාගෙන යනු ඇත.

## ප්‍රාදේශීය සැලසුම් සහ මෙහෙයුම් කමිටුව

ග්‍රාමශක්ති ව්‍යාපාරයට අයත් ග්‍රාම සේවා වසම් තෝරා ගත් පසු, ඒවායේ ජනතා සමාගම් පිහිටුවා ග්‍රාම සංවර්ධන සැලසුම් සකස්කර, ක්‍රියාත්මක වීමේ ක්‍රියාවලිය පහසුකරණය, ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක වන රේඛීය ආයතන සහ පෞද්ගලික අංශයේ වැඩසටහන් තෝරාගත් ග්‍රාමසේවා වසම් වෙත යොමු වීමට සමායෝජනය සහ අඛණ්ඩව ප්‍රගතිය පළාත් කමිටුවට වාර්තා කිරීම මෙම කමිටුවේ කාර්යයයි. එහි සංයුතිය පහත පරිදි වනු ඇත:

- ප්‍රාදේශීය ලේකම්
- සැලසුම් අධ්‍යක්ෂ
- සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ
- කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ
- ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
- පෞද්ගලික අංශයේ නියෝජිතයින්

## දිළිඳුකමට බලපාන හේතු නැති කිරීම සඳහා වන පෞද්ගලික අංශයේ මැදිහත්වීම :

මෙම වැඩසටහන යටතේ සෑම දිස්ත්‍රික්කයක් තුළම ග්‍රාමශක්ති වැඩසටහන යටතේ පිහිටවනු ලබන ජනතා සමාගම් සහ නිෂ්පාදන ඒකාබද්ධ සමාගම්වල ආර්ථික පැවැත්ම තිරසර කරනු සඳහා පෞද්ගලික අංශයේ සහාය ලබාගනු ඇත.

එහිලා, සෑම දිස්ත්‍රික්කයක් තුළම ක්‍රියාත්මක ජනතා සමාගම්වල ව්‍යවසායකත්ව අරමුණු සාක්ෂාත් කරලීම උදෙසා පෞද්ගලික අංශයේ සමාගමකට හෝ සමාගම් කිහිපයකට සම්බන්ධීකරණ වගකීම පැවරෙනු ඇත. ඒ යටතේ එම සමාගම් පහත ආකාරයේ පහසුකම් සැපයීමට කටයුතු කරනු ඇත.

- ව්‍යවසායකත්ව වර්ධනය සඳහා කටයුතු කිරීම.
- ව්‍යවසායකත්ව තොරතුරු, තාක්ෂණික තොරතුරු හා වෙළෙඳපොළ තොරතුරු ලබාදීම.
- අගයදාම කළමනාකරණය සඳහා පහසුකම් සැපයීම.
- සැපයුම්දාම කළමනාකරණය සඳහා පහසුකම් සැපයීම.
- යෙදවුම් බාහිර මූලාශ්‍රකරණය සඳහා පහසුකම් සැපයීම.

මෙම පහසුකම් සහ තොරතුරු සැපයීමේදී පහත සඳහන් ක්ෂේත්‍ර වර්ධනය සඳහා මූලික අවධාරණයක් ලබාදෙනු ඇත.

- කෘෂි නිෂ්පාදන පදනම් කරගත් ව්‍යවසාය ඇරඹීම සහ පවත්වාගෙන යාම.
- කෘෂිකර්මාන්තය සඳහා වන බීජ නිෂ්පාදනය, පසු අස්වනු තාක්ෂණය සහ ආහාර විද්‍යාව දියුණු කිරීම සඳහා වන උපදේශනය හා ව්‍යවසාය ඇරඹීම හා පවත්වාගෙන යාම.
- කෘෂි සේවා සැපයීමට අදාළ ව්‍යවසාය වර්ධනය, ගබඩාකරණය, වෙළෙඳපොළ, අගය එක් කිරීම සඳහා වන උපදේශනය හා ව්‍යවසාය ඇරඹීම හා පවත්වාගෙන යාම.
- කෘෂි පර්යේෂණ, සංවර්ධනය හා උපදේශන සේවාවන්ට අදාළ ව්‍යවසායකත්ව සංවර්ධනය.

පෞද්ගලික අංශය විසින් ඉහත කී සේවාවන් සඳහා සම්බන්ධීකරණයට මැදිහත් වන අතරතුරෙහිදීම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පදනම් කොට ගත් ප්‍රාදේශීය සංවර්ධන වැඩපිළිවෙළ පදනම් කොට ගෙන පහත සඳහන් මැදිහත්වීම් ද යෝජනා කරනු ලබයි.

- හඳුනාගත් සම්පත් පදනම් කොට ගත් නිෂ්පාදන බිහිකිරීම සඳහා පෞද්ගලික අංශයේ ආයෝජනය.
- ප්‍රාදේශීයව රැකියා අවස්ථා බිහි කිරීම සඳහා වන පෞද්ගලික අංශයේ වැඩපිළිවෙළ.
- සානුබල සැපයීම හා ධනාත්මක ව්‍යවසායක පරිසරයක් ගොඩනැගීම සඳහා වන මැදිහත්වීම්.

**දිළිඳුකමට බලපාන්නා වූ හේතු නැති කිරීම සඳහා වන ජනතා මැදිහත්වීම් සහ ඒ සඳහා වන ආයතන ව්‍යුහයක් සැකසීම :**

දිළිඳුකම මැඩලීම සඳහා දැනටමත් ක්‍රියාත්මක, ජනතා මැදිහත්වීම සංවිධානය කරනු ලබන සමෘද්ධි වැඩසටහන ඇතුළුව රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන මගින් පහසුකරණය කෙරෙන සමගාමී වැඩසටහන්වලට සමාන්තරව ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරය ප්‍රජා පාලිත ග්‍රාමීය සංවර්ධන වැඩසටහනක් ලෙස මෙනයින් හඳුන්වාදෙනු ලබයි.

**මෙම වැඩසටහන හඳුන්වාදීම සඳහා පාදක වන සමාජ යථාර්ථයන් :**

- රට තුළ පූර්ණ දිළිඳුභාවය අවම තත්ත්වයකට ගෙන ඒම සිදුවී නැති නමුදු, දිළිඳුභාවය අවම කිරීමේදී එහි තිරසරභාවයක් සාක්ෂාත් කරගැනීමේ අවශ්‍යතාවය,
- රට තුළ පූර්ණ දුගීභාවය අවමව ඇති තත්ත්වයක් තුළ දී පවා තවමත් පූර්ණ දිළිඳුභාවය, සාපේක්ෂ දිළිඳුභාවය මෙන්ම කුඩා දරුවන් අතර මන්ද පෝෂණය ඉහළ මට්ටමක පැවතීම,
- රට තුළ වෙසෙන දිළිඳු කණ්ඩායම් සීමාව ආසන්නයේ ජීවත්වන ජනතිරු නැවතත් දිළිඳුභාවයේ සීමාවෙන් පහතට වැටීමට පවතින අවදානම,
- දශක 07 කට ආසන්න කාලයක් තිස්සේ ක්‍රියාත්මක වන සමාජ සුභසාධන වැඩපිළිවෙළ හරහා සමාජ දිළිඳුභාවය අවම කිරීමට නොහැකිවීම,
- ආර්ථිකය සමෘද්ධිමත් බව කියැවෙන දිස්ත්‍රික්ක තුළ පවා සැවොම ඇතුළත් (අන්තර්ග්‍රාහී) ආර්ථික සංවර්ධනයක් (Inclusive Growth) හඳුන්වාදීමට නොහැකිවීම නිසා නගරය සහ ගම තිරස්ව සම්බන්ධ කරමින්, පූර්ණ දිළිඳු කණ්ඩායමට හෝ සාපේක්ෂ දිළිඳු කණ්ඩායමට හෝ දිළිඳුකම ආසන්නයේ ජීවත්වන ආර්ථික කණ්ඩායම්වලට සංවර්ධනයේ හා ආර්ථිකයේ ප්‍රතිලාභ සහ සම්බන්ධ කරවීමට මේ තාක් දුරට නොහැකි වීම,
- සැවොම ඇතුළත් කරගන්නා වූත් (Inclusive), වගවීම තහවුරු කරන්නා වූත් ප්‍රත්‍යන්තයේ ක්‍රියාත්මක වෘත්තිමය සංවිධාන ජාලයක් නොවීම හේතු කොටගෙන, දිළිඳුකම මැඩලීම සඳහා දියත් කොට ඇති රාජ්‍ය හා රාජ්‍ය නොවන සේවා කාර්යක්ෂම ලෙස උකහා ගැනීමට නොහැකිවීම මෙන්ම ඒ සඳහා වන විදේශ ආධාර හෝ විදේශ ආධාර යටතේ සිදුකෙරෙන සම්පත් සාධනය උකහා ගැනීමට නොහැකිවීම,
- ක්‍රියාත්මක වන්නා වූ ක්ෂුද්‍ර ණය යෝජනා ක්‍රම හරහා ලබාදෙන ණය, නිෂ්පාදනය කේන්ද්‍ර කොට ගත් නිෂ්පාදන ණය සඳහා පරිවර්තනය කරගැනීමට ඇති නොහැකියාව නිසා ග්‍රාමීය දිළිඳු ජනතාව පවතින ක්ෂුද්‍ර ණය යෝජනා ක්‍රම, පාරිභෝජන ණය ලබාගැනීම සඳහා උපයෝගී කරගැනීම,
- ග්‍රාමීය ප්‍රදේශ තුළ තිරසර නොවන මට්ටමේ ණය විෂම චක්‍රයක් තුළ දිළිඳු ජනතාව සිරවීම,

- දිළිඳුකමින් මිදීමේ ස්වයං විශ්වාසය තහවුරු කෙරෙන ශක්තිමත් ව්‍යවසායකත්ව අදහස් හා ඒ සඳහා වන තිරසර වැඩපිළිවෙළක් නොවීම හා ජනතාව ආර්ථිකව සවිබල ගැන්වීම සඳහා ගොඩනැගුණු ධනාත්මක ව්‍යවසායකත්ව සංවර්ධන පරිසරයක් නොවීම, ඒ සඳහා වන සානුබලගැන්වීම් වැඩපිළිවෙළක් නොවීම,
- දැනට ක්‍රියාත්මක වන සානුබලගැන්වීමේ රාජ්‍ය හා රාජ්‍ය නොවන වැඩපිළිවෙළ මධ්‍යයේ වුවද ග්‍රාමීය දිළිඳු පවුල්වල ආදායමේ උච්චාවචනය සමනය කරලීමට නොහැකිවීම,
- දීර්ඝකාලීන මැදිහත්වීමේ ක්‍රියාවලියක් තුළ වුවද තවමත් දළ ජාතික නිෂ්පාදිතයට ග්‍රාමීය ක්ෂේත්‍රයන් ලබාදෙන දායකත්වය ඉහළ අගයක් ගැනීම,
- ප්‍රත්‍යන්තයේ වෙසෙන ජනතාව තවමත් භූගෝලීය වශයෙන් යැපුම් ආර්ථිකයක් තුළ කොටුවී සිටීම.

ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරය ඉහත කී සියලු අභියෝග සඳහා දෘෂ්ටිමය, මූලෝපායික, ආයතනික හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් තුළින් විකල්ප විසඳුම් ලබාදීම අරමුණු කොටගෙන හඳුන්වාදෙනු ලබයි.

## ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරයේ මැදිහත්වීම :

- රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සහයෝගයෙන් හා පහසුකම්කරණයෙන් යුතුව, බිම් මට්ටමේ වගකීම් දරන ප්‍රජාතන්ත්‍රවාදී සහ කාර්යක්ෂම ආයතන ජාලයක් ගොඩනැගීම.
- එම ආයතන දිළිඳු මහජනතාවගේ ඉදිරිපත්වීමෙන්, ඔවුන්ගේ සහභාගීත්වයෙන් හා ඔවුන්ගේ තීන්දු තීරණ මතින් ක්‍රියාත්මක කිරීම.
- ජනතා ආර්ථික හා සංවර්ධන ක්‍රියාවලිය මෙහෙයවීම සඳහා සහභාගීත්ව සංවර්ධනය හා සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ මනා පරිචයක් සහිත පහසුකාරකයන්, සංවිධාන හා ජනතාව සමග යෙදවීම.
- ජනතා සමාගම් එකතු කොට නිෂ්පාදන, සේවා ඒකාබද්ධ සමාගම් පිහිටුවීම, එම ඒකාබද්ධ සමාගම් දැනටමත් පවතින පොදු ජනතා ආයතන සමග සම්බන්ධ කිරීම.
- ජනතා සමාගම් සහ අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කරන්නන් සඳහා තාක්ෂණික, කළමනාකරණ හා පොදු ප්‍රතිපත්ති මෙහෙයවීමට අදාළ පුහුණුව ලබාදීම හා ඒ සඳහා වන ආයතන බිහිකිරීම, සංවිධාන අතර අත්දැකීම් හුවමාරු කරගැනීමේ වැඩසටහන් හඳුන්වාදීම.
- තත්කාලීන තොරතුරු ජනතාව අතර බෙදා හැරීම සඳහා සංයුක්ත සන්නිවේදන ක්‍රියාදාමයක් බිහි කිරීම සහ ඒ යටතේ තොරතුරු තාක්ෂණික මෙවලම් ජනතාවට හඳුන්වාදීම.

- ජනතා සමාගම්වල සංයුතිය, එකඟ වූ නිර්ණායක මත ගොඩනැගීම හා ක්‍රියාකාරීත්වයේදී එකඟ වූ පොදු ප්‍රතිපත්ති සමුදායකට අනුගත වීම.
- ජනතා සමාගම් ගොඩනැගීමේදී. දැනටමත් **<u>ගැමිදිරිය</u>** වැඩසටහන යටතේ පිහිටුවා ක්‍රියාත්මක වන ජනතා සමාගම් මෙම වැඩපිළිවෙළට බද්ධ කොට ගැනීම.
- ග්‍රාමශක්ති වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන රාජ්‍ය නිලධාරීන් සහ පහසුකම් සපයන්නන්ට නිරන්තර ගුණාත්මකභාවය, කාර්යක්ෂමතාවය හා සඵලදායකත්වය ඉහළ දැමීමේ සාකච්ඡා සහ පුහුණු වැඩසටහන් හඳුන්වාදීම.
- ගොඩනැගෙන ජනතා සහභාගීත්ව ආර්ථික හා සංවර්ධන ක්‍රියාවලිය, සැලසුම්ගතව ක්‍රියාත්මක කරන ප්‍රාදේශීය ක්ෂුද්‍ර ආර්ථික වැඩපිළිවෙළෙහි ඉලක්කගත වැඩපිළිවළෙක් වීම.
- එකී ජනතා ආර්ථික හා සංවර්ධන ක්‍රියාවලිය සඳහා ඒක පුද්ගල ආයෝජන නිර්නායක මත පදනම් වූ කාලවකවානු සහ සංවර්ධන කොන්දේසි කේන්ද්‍ර කොට ගත් රාජ්‍ය ප්‍රාග්ධන ආයෝජනයන් සහතික කිරීම.
- එකී ජනතා ආර්ථික හා සංවර්ධන ක්‍රියාවලියෙහි තිරසරභාවය සහතික කිරීම සඳහා ජනතා ආයෝජනය සහතික කිරීම සහ ඒ සඳහා ප්‍රජා දායකත්වය සහිත ප්‍රජා ඉතුරුම් ක්‍රම සහ බාහිර ආයෝජන ක්‍රම හඳුන්වාදීම.
- එකී ජනතා ආර්ථික හා සංවර්ධන ක්‍රියාදාමයේ තිරසරබව සහතික කිරීම සඳහා ව්‍යවසායකත්ව සංවර්ධනය, අගයදාම කළමනාකරණය, සැපයුම්දාම කළමනාකරණය හා යෙදවුම් බාහිර මූලාශ්‍රකරණය සහතික කිරීම සඳහා පෞද්ගලික අංශයේ මැදිහත්වීම සහතික කිරීම.
- එකී ජනතා ආර්ථික සහ සංවර්ධන ක්‍රියාදාමයේ තිරසරභාවය තහවුරු කරනු වස් කළමනාකරණ උපදේශන සේවා සහතික කිරීම.
- එකී ජනතා ආර්ථික සහ සංවර්ධන ක්‍රියාදාමයේ තිරසරභාවය තහවුරු කිරීම සඳහා සානුබල සැපයුම හා ධනාත්මක ව්‍යවසායක පරිසරයක් නිර්මාණය කිරීම.
- එකී ජනතා ආර්ථික සහ සංවර්ධන ක්‍රියාදාමය ප්‍රතිඵල පාදක කොටගත්, සැලසුම්කරණයකට අධීක්ෂණයකට හා පසුවිපරමට නිරන්තරයෙන් ලක් කිරීම.

# ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරය

## හැඳින්වීම :

පුද්ගල ශක්තීන් අකර්මණ්‍ය කෙරෙන යැපුම් මානසිකත්වය ප්‍රත්‍යන්තයේ ජනතාව මුහුණදී ඇති ගැටලු හඳුනාගැනීමේදී මූලිකත්වයට පැමිණෙයි. ප්‍රත්‍යන්තයේ ජීවත්වන දිළිඳු මෙන්ම දිළිඳු සීමාවට ආසන්න ජනතාව තුළ අඩක් කාන්තාවන්ය. ඔවුන් තවමත් තීරණ ගැනීමේ ක්‍රියාවලියේ කොටස්කරුවෝ නොවෙති. එසේම ප්‍රජා සංවර්ධන සැලසුම්කරණයේදී බොහෝ විට එකී සැලසුම්කරණය පීඩිත පාර්ශව මුහුණ දෙන්නා වූ යථාර්ථයන් පිළිබඳව සංවේදී නොවීම නිසා සිදුකෙරෙන්නා වූ සැලසුම් මගින් යෝජිත විසඳුම්, විසඳාලිය යුතු ගැටලු කරා ඉලක්ක නොවේ. ඒ නිසාම අදාළ ව්‍යාපෘතීන් තුළ ආයෝජනය කිරීම සඳහා ප්‍රාග්ධන සම්පත් ප්‍රමාණවත් නොවන බවක් පෙන්නුම් කෙරේ. සැබෑ ලෙසම දිළිඳුකම පිටුදැකීමට මෙකී අමිහිරි යථාර්ථයන් ඉවත් කළ යුතුව තිබේ. අවශ්‍ය ප්‍රතිපත්තිමය හා ප්‍රාග්ධන පහසුකම් ලබාදෙන තත්ත්වයක් තුළ තීරණ ගැනීමේ බලය සහ සම්පත් යෙදවීමේ මූලෝපායන් තීරණය කිරීම ප්‍රජාවට ලබාදුනහොත්, ඔවුන් එම සම්පත් ඵලදායක ලෙස කළමනාකරණයට කටයුතු කරන බව දැනටමත් ලාංකික උදාහරණ මගින් පෙන්වාදී තිබේ. දිළිඳු පවුල්, සවිමත් ආර්ථික ඒකකයන් බවට පත්වීමට උත්සහ කිරීමේදී වෙළෙඳපොල ජයගැනීමට ආර්ථිකමය වශයෙන් මෙන්ම සංස්කෘතික වශයෙන් ද දුෂ්කරතාවයන් රැසකට මුහුණදීමට සිදුවන්නේය. එමනිසා කාන්තාවන්ට, තරුණයන්ට, පසුගාමී සමාජ නියෝජනය කරන්නන්ට ප්‍රමුඛතාවය දෙමින්, ඔවුන් සාමූහිකව, ආයතනගතව ආර්ථික හා සමාජයීය සංවර්ධන ක්‍රියාවලියකට පෙළඹවීම, වඩාත් ප්‍රතිඵලදායක වනු ඇත. එසේ ආයතනගත වීමේදී ඔවුන් වගවීමකට යටත් වන අතර කාර්යක්ෂමතාවය හා සඵලදායක ඉලක්ක සඳහා සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදී තීන්දු ගැනීමේ ක්‍රියාවලියකට පහසුවෙන් යොමු කිරීමටත්, මෙකී තීරණ හුදෙක් බහුතරයේ ප්‍රජාතන්ත්‍රවාදය මගින් හැසිරවීම වෙනුවට කල්තබා එකඟවූ, ගුණාත්මක, ආයතනිකව පිළිගත් වටිනාකම් සමුදායක් ඔස්සේ එළඹීමට ප්‍රයත්න දැරීම තුළින් මෙම ක්‍රියාවලිය තුළ එකවර, එක් පුද්ගලයෙක් තුළ සමෘද්ධිමත් ආර්ථික මිනිසෙකු මෙන්ම, වගකීම් උසුලන, අයිතිවාසිකම් හඳුනන සමාජයීය මිනිසෙකු බිහි කිරීමට හැකිවනු ඇත.

## දැක්ම :

දිරිමත්ව, සවිමත්ව, විධිමත්ව සංවිධානය වී දිළිඳුකමින් මිදී දියුණුවේ මාවතට පිළිපන් ශ්‍රී ලාංකික ජනතාවක්

## මෙහෙවර :

වසර 2020 වන විට ප්‍රජා පාලිත ග්‍රාම නිලධාරි වසම් පන්දහසක් ඇති කිරීම තුළින් එකී ග්‍රාමයන් තුළ ජීවත් වන ජනතාවගේ මූලික අවශ්‍යතාවයන් ද, වර්ධනය වන අවශ්‍යතාවයන් ද, පුද්ගලයන් ලෙස ද, සාමූහිකව ද, අත්පත් කරගැනීම සඳහා ප්‍රජාවට තොරතුරු, තීරණ ගැනීමේ බලය සහ සම්පත් සම්පාදනය මඟින් පහසුකරණය සැපයීම.

**අරමුණු හා ඉලක්ක :**

- 2017 වර්ෂය අවසාන වන විට වඩාත් දිළිඳුබවින් පෙළෙන දිස්ත්‍රික්ක වල, දිළිඳුකම ඉහළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ හඳුනා ගන්නා ග්‍රාම නිලධාරි වසම් හත්සියයක් තුළ නීතියේ විධානයට, යහපාලන මූලධර්ම වලට හා පිළිගත් පරමාදර්ශයන්ට යටත් ක්ෂුද්‍ර ජනතා සමාගම් ගොඩනැගීම.
- දැනටමත් ගැමිදිරිය යටතේ පිහිටුවා ඇති ජනතා සමාගම් 2040ක් වර්ෂ 2017 වන විට ආයතන වශයෙන් යාවත්කාල කර ග්‍රාමශක්ති ව්‍යාපාරයට සම්බන්ධ කර ගැනීම.
- තෝරා ගත් නව ග්‍රාම සේවා වසම්වල සංවර්ධන අරමුදල සඳහා එක් පුද්ගලයෙකුට රු. 8000 වන සේ ගණනය කෙරෙන අරමුදලක් ආයෝජනය සහ ජනතා සමාගම ලබාගන්නා ප්‍රගතිය මත වාර්ෂිකව අරමුදල් නිදහස් කිරීම.
- නව තාක්ෂණය හා නවෝත්පාදනය පිළිබඳ අවධාරණයක් සහිතව ග්‍රාමීය කෘෂිකාර්මික ව්‍යවසායකත්වය පුළුල් කිරීම.
- ග්‍රාමීය ව්‍යවසායකත්වය නගා සිටුවීම සඳහා ප්‍රාග්ධනය සැපයීමේ භාර අරමුදලක් පිහිටුවීම.
- ග්‍රාමීය ව්‍යවසායකත්වය නගා සිටුවීම සඳහා කළමනාකරණය, තාක්ෂණය, වෙළෙඳපොළ පහසුකම් සැපයීම සඳහා සානුබල මධ්‍යස්ථාන ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් බිහි කිරීම.

**සංවිධානගතවීමේ මූලෝපායන් :**

- ප්‍රාදේශීය ලේකම්වරයාගේ පහසුකරණය යටතේ යෝජිත ග්‍රාම නිලධාරි වසම් හඳුනා ගැනීම.
- සහභාගීත්ව සංවර්ධන මූලෝපායන් උපයෝගී කරගනිමින් ඉලක්ක කණ්ඩායම් හඳුනාගැනීම සහ පුහුණු කිරීම.
- ඉලක්කගත කණ්ඩායම්වල පුහුණුව ලත් සාමාජිකයන්ගේ සහභාගීත්වයෙන් නිශ්චිත ඉලක්කගත ව්‍යවසායකත්ව අරමුණු සහිත ව ක්ෂුද්‍ර ජනතා සමාගම් ගත වීම.
- කණ්ඩායම් ඉතුරුම් සහ ආයෝජන බිහි කිරීම සහිත ග්‍රාම සංවර්ධන සැලසුම් සැකසීම.
- පහසුකම් සපයන්නන්ගේ අධීක්ෂණය යටතේ ව්‍යාපෘති අරමුණු කරා මෙහෙයවීම.

**සංවිධාන සංස්කෘතිය :**

ක්ෂුද්‍ර ජනතා සමාගම් තුළ සාමාජිකත්වය ලබන්නන් පහත සඳහන් වටිනාකම් මත සිය කාර්යභාරය ඉදිරියට ගෙන යාමට කටයුතු කළ යුතුව තිබේ.

- එකමුතුකම - සාමුහිකත්වය සෑම විටම ආරක්ෂා කිරීම.
- ආත්මශක්තිය - සෑම පුද්ගලයෙකුගේම ස්වයං අභිමානයට ගරු කිරීම.

- විශ්වාසය - අන්‍යෝන්‍ය පුද්ගලාන්තර විශ්වාසය අත්හළ නොහැකි වටිනාකමක් ලෙස පවත්වාගෙන යාම.
- වගවීම - වගවීම පිළිබඳ ආකල්පය.
- නිවැරදි දැක්ම - අනුභූතික හා යථාර්ථවාදී විශ්වාසයන් මත කටයුතු කිරීම.
- අරපිරිමැස්ම - සකසුරුවම් බව.
- සමානාත්මතාව - සමානාත්මතාවයට ගරු කිරීම.
- එකඟතාව - හෘද සාක්ෂියට ගරු කිරීම.
- විනිවිදභාවය - පාරදෘෂ්‍යභාවය රැකීම.
- නිහතමානිකම - සුහදභාවය රැකීම.

## ආයතනික ව්‍යුහය :

- ක්ෂුද්‍ර ජනතා සමාගම්වලට රාජ්‍ය අරමුදල් සම්පාදනය ක්‍රියාකාරීත්වය, සංවර්ධනය හා මූල්‍ය කටයුතුවලදී ග්‍රාම ශක්ති මෙහෙයුම් අත්පොතෙහි පරිදි ප්‍රජාපාලිත ක්‍රමවේදය අනුගමනය කෙරෙන ආකාරය ප්‍රාදේශීය ලේකම්වරයාගේ අධීක්ෂණයට ලක්වනු ඇත.
- ක්ෂුද්‍ර ජනතා සමාගම්වල අභිමතය පරිදි ප්‍රාදේශීය සභාවකින් ද එහි නියෝජිතයන්ගෙන් සමන්විත දිස්ත්‍රික්ක කැඳවුම් කමිටුවකින් ද ජාතික සම්මේලනයක් තුළ රැස්වන ජාතික විධායක සභාවකින් ද ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරය සමන්විත වනු ඇත.
- ගොඩනැගෙන ක්ෂුද්‍ර ජනතා සමාගම් හා ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරය පවත්වාගෙන යාමට අවැසි පහසුකම් සැපයීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ පිහිටුවා ඇති දිළිඳුකම පිටුදැකීමේ ලේකම් කාර්යාලය විසින් සම්පත්දායකයින්ගේ හා පහසුකම් සපයන්නන්ගේ සංචිතයක් ගොඩනගනු ඇත. එම ජාලය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පදනම් කර ගනිමින් ග්‍රාම සේවා වසම් මට්ටමේ ක්ෂුද්‍ර ජනතා සමාගම් සමග සම්බන්ධීකරණය සපයනු ඇත.

## ප්‍රජා මෙහෙයුම :

ක්ෂුද්‍ර ජනතා සමාගම් ක්‍රියාකාරීත්වය තහවුරු කරනු සඳහා එකී සමාගම්වල නියෝජිතයින්ගෙන් සමන්විත කථිකාවක් ඔස්සේ අභ්‍යන්තර රීති පද්ධතියක් ද ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරයේ යහ පැවැත්ම හා ක්‍රියාකාරීත්වය සඳහා රීති පද්ධතියක් ද සහිත ග්‍රාමශක්ති ප්‍රජා මෙහෙයුම් අත්පොතක් නිර්මාණය කරනු ඇත.

**ව්‍යාපෘති නිමවුම් සඳහා ක්‍රියාකාරකම් :**

- වසර 2020 වන විට **"ග්‍රාමශක්ති වැඩසටහන"** යටතේ ප්‍රජා පාලිත ග්‍රාම සේවා වසම් පන්දහසක් (5000) ඇති කිරීම.

- ග්‍රාම සේවා වසමක ජනගහනය අනුව රු.8000ක් සේ ගණන් බැලෙන ඒක පුද්ගල රාජ්‍ය ආයෝජනයක් ග්‍රාමීය සංවර්ධන අරමුදලක් ලෙස වසර 4ක කාලයක් සඳහා ග්‍රාම සේවා වසම් සඳහා සෘජුව ලබාදීම.

- ජීවන මාර්ග දියුණු කරගැනීම, සංවර්ධන තීන්දු තීරණ ප්‍රජාව විසින් ගැනීමේදී ප්‍රතිඵල පාදක කරගත් රාජ්‍ය මූල්‍ය ආයෝජනය.

- ප්‍රජාවගේ ව්‍යවසායකත්වය වර්ධනය කිරීමේදී ප්‍රාග්ධන පහසුකම් ලබාදීම.

- ග්‍රාමීය ව්‍යවසායකත්වය වැඩි දියුණු කිරීමට පෞද්ගලික අංශයේ සක්‍රීය සහභාගීත්වය.

- දුගී බවින් මිදී ව්‍යවසායකත්වයට පරිවර්තනය කිරීමේදී ක්‍රමානුකූල වැඩසටහනක්.

- ව්‍යවසායකත්වයට පිවිසීමේදී මානව සාමුහිකත්වය ඉස්මතු කරන ක්ෂුද්‍ර ජනතා සමාගම් ගොඩනැගීම.

- රාජ්‍ය හා පෞද්ගලික අංශයේ අත්වැල් බැඳ ගැනීම තුළ දිළිඳුකම පිටුදැකීම සඳහා සංවර්ධන හා පර්යේෂණ පහසුකම් ලබාදීම.

- රාජ්‍ය, පෞද්ගලික හා ග්‍රාමශක්ති වැඩසටහන අත්වැල් බැඳ ගනිමින්, වෙළෙඳපොළ අතික්‍රමණය කිරීම සඳහා පහසුකම් හා අතහිත ලබාදීම.

- නව තාක්ෂණය හා නවෝත්පාදනය පිළිබඳ අදහස් පදනම් කරගනිමින් ග්‍රාමීය කෘෂිකාර්මික ව්‍යවසායකත්වය වැඩි දියුණු කිරීම.

- මෙම වැඩපිළිවෙළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සම්බන්ධීකරණය කිරීම.

- සමස්තයක් වශයෙන් ජනතාවගේ මූලික අවශ්‍යතා හා ගොඩනැගෙන අවශ්‍යතා පිරිමැසීම සඳහා ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් වැඩපිළිවෙළක් ගොඩනැගීම.